**කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය - 2020**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව, මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය නොකළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධපාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී,ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිත කර ඇති බව,

**1.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**ගෙවිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සානා ව්‍යාපෘතිය යටතේ ගෙවිය යුතු වියදම් වශයෙන් දක්වා ඇති රු.849,307 ක මුදලක් වසර 05 කට වැඩි කාලයක් ගතවී ඇතත්, සමාලෝචිත වර්ෂය අවසානයටද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2020 දෙසැම්බර් 31 දින වන විටත් මෙ සම්බන්ධයෙන් අවසන් තීරණයක් ගෙන නොමැති අතර අදාළ තානාපති කාර්යාලය හරහා යොෂුවා ටෙක් ආයතනය සම්බන්ධ කරගැනිමට උත්සහ දරනු ලැබේ. | නිරවුල් කළ යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

**1.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| | නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | මුදල් රෙගුලාසි 757 | සෑම වර්ෂයකට වරක්ම භාණ්ඩ සමීක්ෂණ පැවැත්විය යුතු වුවත් කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පුස්තකාලය සඳහා 2016 වර්ෂයෙන් පසු භාණ්ඩ සමීක්ෂණ පවත්වා නොතිබුණි. | වර්තමානයේදී පුස්තකාල පොත් ලේඛනය සියයට 98 ක් පමණ යාවත්කාලීන කර ඇති අතර ඉදිරි වර්ෂවල දී අවශ්‍ය පරිදි භාණ්ඩ තොග සමීක්ෂණය වාර්ෂිකව සිදු කළ හැක. | මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) | 1971 අංක 38 දරන මුදල් පනතේ XI වන වගන්තිය හා | මුදල් අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව ආයතනයේ ඇති අතිරික්ත | අනුමැතිය ලබා ගැනීමෙන් පසු ආයෝජන කටයුතුවල | මුදල් පනතේ සහ චක්‍රලේඛ විධිවිධානවලට |

| | | | |
|---|---|---|---|
| 2003 ජූනි 02 දිනැති අංක PED/02 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 ඡේදය | මුදල් ආයෝජනය සිදු කළ හැකි වුවත්, එවැනි අනුමැතියකින් තොරව රු.85,000,000 ක මුදලක් ස්ථාවර තැන්පතු 02 ක හා රු.4,000,000 ක මුදලක් ඉල්ලුම් තැන්පතු දෙකක ආයෝජනය කර තිබුණි. | නියැලීමේදී වර්ෂ අවසාන අතිරික්තය නියමිත දිනම ආයෝජනය කිරීමේ ප්‍රායෝගික දුෂ්කරතා ඇති නිසා ආයතනයේ අනුමැතීන්වලට යටත්ව ආයෝජන කටයුතු කර මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය සඳහා යොමු කරන ලදි. | අනුකූලව කටයුතු කළ යුතුය. |

**1.7 මුදල් කළමනාකරණය**

---------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පුනරාවර්තන සහ ප්‍රාග්ධන ප්‍රදාන වශයෙන් මහා භාණ්ඩාගාරය විසින් අරමුදල් ලබාදී තිබියදී අතිරික්ත මුදල් ආයෝජනය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.628,407,413 ක ස්ථාවර තැන්පතු ශේෂයක් පැවතුණි. එබැවින් පශ්චාත් උපාධි පාඨමාලා ගාස්තු අඩු කර වැඩි පිරිසකට උපාධි හැදෑරීම සඳහා අවස්ථාව ලබාදීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු කර නොතිබුණි. | පුනරාවර්තන වියදම් යටතේ වැටුප් හා වේතන සඳහා පමණක් මුදල් ප්‍රතිපාදන ලබාදෙන අතර ප්‍රාග්ධන වියදම් සඳහා සුළු ප්‍රතිපාදනයක් ලබා දෙයි. පාඨමාලාවන්ට අදාළ මුළු ලැබීම්වලින් සියයට 20 ක පමණ ආදායමක් ද ස්ථාවර තැන්පතු පොලී ආදායමද ප්‍රධාන කොටගත් අනෙකුත් ලැබීම් සියල්ලම අනිකුත් සියළුම පුනරාවර්තන වියදම් සහ ප්‍රාග්ධන වියදම් දැරීමට භාවිතා කළයුතු බැවින් පාඨමාලා ගාස්තු අඩු කළ නොහැකි වේ. | සියලු අරමුදල් ප්‍රශස්තව උපයෝජනය කර ආයතනයේ කාර්යසාධනය ඉහළ නැංවීමට කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

-----------------------

**මූල්‍ය ප්‍රතිඵල**

---------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.63,559,843 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.61,357,388 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,202,455 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පුනරාවර්තන වියදම් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පශ්චාත් උපාධි සම්පූර්ණ කරන ලද සිසුන් විසින් පර්යේෂණ කෘතීන් 125 ක් ආයතනය වෙත භාරදී තිබුණි. එකී කෘතීන් ජාතික හෝ ජාත්‍යන්තර පිළිගත් ප්‍රකාශන මඟින් ප්‍රසිද්ධ කිරීමට හෝ ඉන් තෝරාගත් කෘතීන් වාණිජකරණය කිරීමට හෝ නවෝත්පාදනය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ පිළිගත් ක්‍රමවේදයන් අනුගමනය කරමින් ආයතනයේ හෝ රටේ අභිවෘද්ධිය සඳහා යොදා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ආයතනය මඟින් වාර්ෂිකව පවත්වන කොන්ග්‍රස් සමුළුවට එම පර්යේෂණ කෘති ඉදිරිපත් කරන අතර එම සමුළුවේදි සමාලෝචන මණ්ඩලයක් මඟින් තෝරා ගැනෙන කෘති Tropical Agriculture Reach journal වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කෙරෙන අතර පොතක් ලෙසට ද මුද්‍රණය කෙරේ. එම වාර්ෂික සමුළුවේ සියලු පර්යේෂණ කෘති ප්‍රධාන පෙලේ රාජ්‍ය හා පෞද්ගලික ආයතන වෙත ලබාදෙන අතර සිසුන්ගේ විද්‍යුත් තැපැල හරහා ඔවුන් සමඟ සම්බන්ධ වීමේ අවස්ථාවද ලැබේ.එසේම ද්වි වාර්ෂිකව නිකුත් කරන PGIA News Letter මඟින්ද සිසුන්ගේ පර්යේෂණ පිළිබඳ තොරතුරු සියලු අදාළ ආයතනවලට යොමු කරනු ලැබේ. | පර්යේෂණ කෘති ජාතික හෝ ජාත්‍යන්තර වශයෙන් ප්‍රසිද්ධ කිරීමට හෝ වාණිජකරණය හෝ නවෝත්පාදනය තුළින් රටේ අභිවෘද්ධිය සඳහා යොදා ගත යුතුය. |

**3.2** අරමුදල් ඌන උපයෝජනය

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පර්යේෂණ කටයුතු සිදු කිරීම සඳහා පර්යේෂණ ප්‍රදාන වශයෙන් ලබාදී ඇති අරමුදල් අදාළ කාර්යයන් සඳහා ප්‍රශස්ත අන්දමින් උපයෝජනය නොකිරීම හේතුවෙන් රු.17,623,244 ක මුදලක් නිෂ්කාර්යව පැවතුණි. | කොවිඩ් 19 වසංගතය නිසාවෙන් පර්යේෂණ කාර්යයන් සැලැසුම්කළ ආකාරයෙන් ඉටු කර ගැනීමට නොහැකි වුවද, 2020 වර්ෂයේ පර්යේෂණ ලැබීම් රු.12,828,901 ක් හා වියදම් රු.8,965,662 ක් විය. | පර්යේෂණ අරමුදල් නියමිත කොන්දේසි ප්‍රකාරව කාර්යක්ෂමව අයුරින් උපයෝජනය කළ යුතුය. |
| (ආ) | වැවිලි කාර්මාන්ත අමාත්‍යාංශයෙන් පර්යේෂණ කටයුතු සඳහා ලැබී තිබූ රු.354,201 ක අරමුදලින් සමාලෝචිත වර්ෂය තුළදී කිසිදු වියදමක් දරා නොතිබුණි. | කොවිඩ් 19 රෝග ව්‍යාප්තිය හමුවේ සරසවිය වසා දැමීමත්, සෞඛ්‍ය ආරක්ෂක ක්‍රමවේදවලට පටහැනිව පර්යේෂණ කටයුතුවල නියැලීමට නොහැකි වූ නිසාත්, අරමුදල භාවිතා කිරීමට නොහැකි විය. | අරමුදල් අදාළ කාර්යයන් සඳහා ප්‍රශස්ත හා කාර්යක්ෂම අයුරින් උපයෝජනය කළ යුතුය. |

**3.3** ප්‍රසම්පාදන කළමනාකරණය

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම අනුව රු.2,868,500 ක් වටිනා මිලදී ගැනීම් 05 කට අදාළව ප්‍රසම්පාදන කටයුතු සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කර නොතිබුණි. | 2020 වසරේ පැවති Covid-19 වසංගත තත්වය මත රට වසා දැමීම හේතුවෙන් ප්‍රසම්පාදන සැලැස්මේ සඳහන් සමහර කාර්යයන් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. | සැලැසුම් කළ කාල සීමාව තුළ ප්‍රසම්පාදන කටයුතු සිදු කළ යුතුය. |
| (ආ) | ගිණුම්කරණ පරිගණක පද්ධතියක් ස්ථාපිත කිරීම වෙනුවෙන් පෞද්ගලික සමාගමක් සමඟ රු.2,100,000 ක මුදලකට ගිවිසුම්ගතවී අත්තිකාරම් වශයෙන් රු.1,500,000 ක මුදලක් ගෙවා තිබූ නමුත්, ගිවිසුම්ගත කාල පරිච්ඡේදය අවසන් වී වසර 02 කට වැඩි කාලයක් ගතවී තිබුණද | මේ වන විට එහි කටයුතු අවසන් මට්ටමේ ඇති අතර 2021 දෙසැම්බර් 31 දින වන විට එය අවසන් කරන බවට සමාගම්කරු සමඟ වන ගිවිසුම යාවත්කාලීන කිරීමට කටයුතු කර ඇත. | ගිවිසුම්ගත කටයුතු මනා අධීක්ෂණයක් හා පාලනයක් යටතේ නියමිත කාලය තුළ අවසන් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පරිගණක පද්ධතිය ස්ථාපිත කර නොතිබුණි. | | |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානය වන විට ශිෂ්‍ය ලියාපදිංචි ගාස්තු රු.11,160,670 ක්ද පාඨමාලා ගාස්තු රු.17,432,712 ක්ද වසර 03 සිට වසර 10 දක්වා කාලයක් අය විය යුතුව පැවතුණි. | සෑම වසරකම උපරිම කාල සීමාව අවසන් කළ සිසුන්ගෙන් යම් ප්‍රතිශතයක් පාඨමාලා හැර යන බැවින් ඔවුන්ගෙන් අයවිය යුතු ප්‍රමාණ හිඟ පාඨමාලා ගාස්තු ලෙස පෙන්නුම් කලද උපාධි සම්පූර්ණ කල කිසිදු සිසුවකුගේ හිඟ පාඨමාලා ගාස්තු පැවතිමට කිසිදු ඉඩක් නොමැති අතර ඒ සඳහා වන අභ්‍යන්තර පාලන ක්‍රමවේද තදින්ම ක්‍රියාත්මක වේ. හිඟ පාඨමාලා ගාස්තු ප්‍රමාණ තීරණය කිරිමේ ක්‍රමවේදය මේ වන විට වෙනස් වී ඇති අතර ඒ අනුව මෙම ප්‍රමාණ වෙනස් විය යුතුය. | නියමිත කාල සීමාව තුළ ලැබිය යුතු සියලු ආදායම් අය කර ගත යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළ නිම කිරීමට අපේක්ෂිත රු.6,877,996 ක් වටිනා අයිතමයන් 13 ක ප්‍රසම්පාදන කටයුතු අවසන් කළයුතු දිනය පසුවී මාස 01 සිට 08 දක්වා කාලයක් ගතවී තිබුණද, එම මිලදී ගැනීම් කටයුතු අවසන් කර නොතිබුණි. | 2020 වසරේ පැවති Covid-19 වසංගත තත්වය මත රට වසා දැමීම හේතුවෙන් ප්‍රසම්පාදන සැලැස්මේ සඳහන් සමහර කාර්යයන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ අතර ක්‍රියාත්මක කරන ලද කාර්යයන් එම වසරේ අවසන් කිරිමට හැකි නොවුවේ වසංගත තත්වය හමුවේ ලෝකය පුරා සියලු සැපයුම් මාර්ග අඩපන වී තිබූ බැවිනි. | සැලැසුම් කළ කාල සීමාව තුළ ප්‍රසම්පාදන කටයුතු අවසන් කළ යුතුය. |

### 3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ නිම කිරීමට අපේක්ෂිත රු.31,107,047 ක් වටිනා ඉදිකිරීම් ව්‍යාපෘතීන් 04 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. | ඉදිකිරීමට අදාළ මූලික ප්‍රසම්පාදන කාර්යයන් ආරම්භ කර සැපයුම්කරුවන් වෙතින් මිල ගණන් කැඳවීම් සිදු කර තිබූ අතර කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට නොහැකි විය. | අපේක්ෂිත කාල සීමාව තුළ සියලු ඉදිකිරීම් කටයුතු නිම කළ යුතුය. |